රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2014 (I)

මගේ අංකය: EST 5/1/49
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2014.12.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්

## 2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය අංශයේ නිලධරයන් සහ විශ්‍රාමිකයන් සඳහා අන්තර් දීමනා ගෙවීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2014 කෙරෙහි අවධානය යොමු කරවමි.

**02.** එම චක්‍රලේඛයේ විධිවිධාන, 2006.09.22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30, 2009.06.01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 (1) යන චක්‍රලේඛයන්ට අනුව වැටුප් ක්‍රම අනුමත කර ඇති සහ එම වැටුප් ක්‍රම අදාල කරගෙන වැටුප් ගෙවනු ලබන සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයන් සඳහා ද අදාල කර ගත යුතුය.

**03.** 2015 අයවැයෙන් යෝජිත පරිදි රාජ්‍ය සේවකයෙකුගේ අවම මූලික වැටුප මසකට රු. 15000/- ක් හා ජීවන වියදම් දීමනාව මසකට රු. 10000/- ක් ඇතුලත් නව වැටුප් චක්‍රලේඛය 2015.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිකුත් කෙරේ. එම නව වැටුප් චක්‍රලේඛයේ සඳහන් වැටුප් හා දීමනා මාණ්ඩලික නොවන නිලධරයන් සඳහා 2015 ජූලි මාසයේ සිට ද, මාණ්ඩලික නිලධරයන් සඳහා 2015 සැප්තැම්බර් මස සිට ද, ඉහත කාලයට අදාල හිඟ වැටුප් ද සමඟ ගෙවනු ලැබේ. එතෙක් සියලුම නිලධරයන් සඳහා දැනට ගෙවනු ලබන රු. 3000/- ක මාසික අන්තර් දීමනාව ගෙවනු ලැබේ.

**04.** රාජ්‍ය සේවක විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ද ඉහත නව වැටුප් චක්‍රලේඛයට අනුව ගලපා සියලුම විශ්‍රාම වැටුප් විෂමතා නිවැරදි කර අදාල විශ්‍රාම වැටුප් චක්‍රලේඛය 2015.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබේ. එම විශ්‍රාම වැටුප් චක්‍රලේඛයට අනුව විශ්‍රාම වැටුප් ගෙවීම 2015 ජූලි මස සිට, ඉහත කාලයට අදාලව හිඟ විශ්‍රාම වැටුප ද සමඟ ගෙවනු ලැබේ. එතෙක් සියලුම විශ්‍රාමිකයන් සඳහා දැනට ගෙවනු ලබන රු. 2500/- ක මාසික අන්තර් දීමනාව ගෙවනු ලැබේ.

**05.** මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය